*සැ. යු.* — 2012.04.27 දින පළ වූ අංක 1,756 දරන *ගැසට් පත්‍රයේ* I-III සහ III කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,757 - 2012 මැයි මස 04 වැනි සිකුරාදා - 2012.05.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 898 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 901 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 මැයි මස 11 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 අප්‍රේල් මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ භාෂා පරිවර්තක තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2012

සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩුව ඇති පහත තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) | 01 |
| භාෂා පරිවර්තක (සිංහල/දෙමළ) | 01 |

02. ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව පදනම් කරගෙන සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් මෙම තනතුරු සඳහා පත් කිරීමට තෝරාගනු ලැබේ. තෝරාගැනීමේ දී සබරගමුව පළාතේ ස්ථිර පදිංචි අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ. පත් කරනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මකවන දිනය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබේ. ඒ සම්බන්ධව අවසාන තීරණය ගැනීමේ බලය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. දැනට පවතින පුරප්පාඩු හා ඉදිරියේ දී ඇතිවන පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කෙරේ. බඳවා ගැනීම් කරනු ලබන්නේ 1 වන පන්තිය සඳහාය.

03. *බඳවා ගැනීමේ කොන්දේසි :*

3.1 අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.

3.2 විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතු ය.

3.3 රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් මෙම තනතුරු සඳහා අයදුම් කරන්නේ නම් ඔවුන් ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට කිසිදු විනය දඬුවමක් ලබා නොමැති එම කාලය තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇති සතුටුදායක සේවා කාලයක් සහිත අය විය යුතු ය.

***සැළකිය යුතුයි*** .- විභාග ඉල්ලුම්පත් භාර ගැනීමේ අවසන් දිනයට පෙර අවශ්‍ය වන සුදුසුකම් සෑම ආකාරයකින්ම සපුරා තිබිය යුතු යි.

04. *වයස් සීමාව.*- ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවු. 21 ට නොඅඩු සහ 40ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරු දරන්නන් අයදුම්කරුවන් වූ විටක ඔවුන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

05. *අධ්‍යාපන සුදුසුකම් .-*

1. (අ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා තිබීම ;

*හෝ*

(ආ) නීතිඥ විභාගය සමත් වී තිබීම ;

*හෝ*

(ඇ) පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ බහුතාක්ෂණික ආයතනයක වානිජ විද්‍යා ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ;

*හෝ*

(ඈ) මොරටුව විශ්ව විද්‍යාලයේ ජාතික තාක්ෂණික ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

*සහ*

2. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) හෝ ඊට සමාන විභාගයක දී දෙවැනි භාෂාවට සම්මාන සාමාර්ථයක් හෝ දෙවැනි භාෂාව පිළිබඳව පිළිගත හැකි ඊට උසස් සුදුසුකම් සමග පළමුවැනි භාෂාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

*සටහන.-*

සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂා විෂයයන්ගෙන් දෙකක් තම උපාධියේ දී සමත්ව ඇති විට, ඔහු/ඇය යෝජිත වැටුප් පරිමාණයේ ආරම්භක වැටුපට පියවර දෙකක් ඉහළින් තබනු ඇත.

06. *වැටුප් පරිමාණ* - (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (IV) අනුව) භාෂා පරිවර්තක 1 පන්තිය සඳහා
රු. 16,920 - 290 x 10-325 x 15-400 x 11-29,095/- (MN-1-2006A)
ආරම්භක පියවර 12 වන පියවර වේ.

07. *සේවා කොන්දේසි.*- මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. එසේම ආයතන සංග්‍රහයට ද, මුදල් රෙගුලාසිවලට ද, රජය විසින් හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ විටින් විට නිකුත් කරනු ලබන නියමයන් හා කොන්දේසි ද, දෙපාර්තමේන්තු නියෝග ද පිළිපැදිය යුතු ය.

08. *විභාගය හා විෂයය නිර්දේශය.*- විභාගය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලැබේ. භාෂා පරිවර්තක සේවයේ 1 පන්තියට පත් කිරීම සඳහා පැවැත්වෙන ලිඛිත විභාගය පහත සඳහන් විෂයයන් පිළිබඳ ප්‍රශ්න පත්‍රවලින් සමන්විතය.

| | | | |
|---|---|---|---|
| 1. | පරිවර්තනය | - ලකුණු 100 | - පැය 03ක ප්‍රශ්න පත්‍රයක් |
| 2. | ඉංග්‍රීසි භාෂාව | - ලකුණු 100 | - පැය 1 1/2 ක ප්‍රශ්න පත්‍රයක් |
| 3. | සිංහල භාෂාව | - ලකුණු 100 | - පැය 1 1/2 ක ප්‍රශ්න පත්‍රයක් |
| 4. | දෙමළ භාෂාව | - ලකුණු 100 | - පැය 1 1/2 ක ප්‍රශ්න පත්‍රයක් |
| 5. | අවබෝධය | - ලකුණු 100 | - පැය 1 1/2 ක ප්‍රශ්න පත්‍රයක් |

*විෂය නිර්දේශය.-*

*පරිවර්තනය.*- කාර්යාලයීය ලියවිල්ලක් හෝ වාර්තාවකින් හෝ පුවත්පත් ලිපියකින් හෝ උපුටා ගන්නා ලද උද්ධෘතයක් ඇතුළු කාර්යාලයීය, විද්‍යාත්මක, නෛතික හා තාක්ෂණික ලියකියවිලි වලින් ද, සම්භාව්‍ය සාහිත්‍ය ග්‍රන්ථ වලින් ද උපුටාගත් දුෂ්කර පාඨ කිහිපයක් පහත දැක්වෙන ආකාර වලින් එකක් අනුව පරිවර්ථනය කිරීම :

(1) සිංහලෙන් දෙමළ බසට හා දෙමළ බසින් සිංහලට
(2) සිංහලෙන් ඉංග්‍රීසියට හා ඉංග්‍රීසියෙන් සිංහලට

ඉංග්‍රීසි/සිංහල/දෙමළ භාෂා ප්‍රශ්න පත්‍ර.-

මේ සඳහා භාෂා තුනෙන්ම ප්‍රශ්න පත්‍ර පිළියෙල කරන අතර, ඉන් අදාළ භාෂා දෙකක ප්‍රශ්න පත්‍රවලට අපේක්ෂකයින් පෙනී සිටිය යුතුය.

(1) *ඉංග්‍රීසි භාෂාව.*- රචනයෙන් දෙන ලද වචන යොදා ඒවායේ අර්ථ පැහැදිලි වන සේ වාක්‍ය තැනීම, වාග් සම්ප්‍රදායක් තේරුම් කිරීම, සංයුක්ත හා සංකීර්ණ වාක්‍ය ඛණ්ඩවලට විග්‍රහ කිරීම.

(2) *සිංහල භාෂාව.*- රචනයක් ලිවීම, සාරාංශයක් ලිවීම, දෙන ලද ඡේදයක් සංක්ෂිප්ත කොට තම වචනයෙන් ප්‍රකාශ කිරීම, වචනවල අර්ථ නිරූපණය වන ලෙස වාක්‍ය තැනීම, වාක්‍යයන්හි ව්‍යාකරණ නිවැරදි කිරීම, වාග් සම්ප්‍රදායන් තේරුම් කිරීම.

(3) *දෙමළ භාෂාව.*- රචනයක් ලිවීම, සාරාංශයක් ලිවීම, දෙන ලද ඡේදයක් සංක්ෂිප්ත කොට තම වචනයෙන් ප්‍රකාශ කිරීම, වචනවල අර්ථ නිරූපණය වන ලෙස වාක්‍ය තැනීම, වාක්‍යයන්හි ව්‍යාකරණ නිවැරදි කිරීම, වාග් සම්ප්‍රදායන් තේරුම් කිරීම.

(4) *අවබෝධය.*- සිංහල/දෙමළ/ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම පිළියෙල කරනු ලබන අවබෝධය ප්‍රශ්න පත්‍රය සඳහා තමන් කැමති එක් භාෂාවකින් පිළිතුරු සැපයීමට අපේක්ෂකයෙකුට ඉඩදෙනු ලැබේ. මේ සඳහා පාඨ ගණනාවක් අපේක්ෂකයින්ට දෙනු ලැබේ. ඇතැම් පාඨයන් සම්බන්ධයෙන් අපේක්ෂකයා වෙත විකල්ප ප්‍රකාශයන් ගණනාවක් ඉදිරිපත් කෙරෙන අතර, ඉන් එකක් එම පාඨයේ ඇති කරුණු වලට වඩාත්ම හොඳින් ගැලපේ. අපේක්ෂකයා වඩාත්ම උචිත ප්‍රකාශය තෝරාගත යුතු වේ. අනෙක් පාඨයන් සම්බන්ධයෙන් ප්‍රශ්න පිළියෙල කරනු ලබන්නේ අපේක්ෂකයා එම පාඨවල අර්ථය වටහාගන්නා ප්‍රමාණය පරීක්ෂා කිරීමට හැකිවන පරිදිය.

*සැළකිය යුතුයි.*- අපැහැදිලි අත්අකුරු සහ අක්ෂර වින්‍යාස දෝෂ සඳහා ලකුණු අඩු කරනු ලැබේ. අත් අකුරු කියවිය නොහැකි අපේක්ෂකයෙකුගේ සුදුසුකම අවලංගු කළ හැක.

පත්වීමක් සඳහා සුදුසුකම් ලැබීමට සෑම ප්‍රශ්න පත්‍රයකින්ම අවම වශයෙන් ලකුණු 40%ක් ලබා ගෙන උසස් ලකුණු එකතුවක් ලබා ගත යුතුය.

09. විභාග ගාස්තුව රු. 450 කි. එම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ 2003-90-01 දරන අදායම් ශීර්ෂයට බැරවන ලෙස සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට/දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම් පත්‍රයේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතු වේ. (කුවිතාන්සියේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) ගෙවන ලද විභාග ගාස්තුව කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

10. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත පරිදි ඉල්ලුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවන්හට තරඟ විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු ලැබේ. තරඟ විභාගය සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. ලිඛිත විභාගයේ දී එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40%ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණු ප්‍රමාණ වල එකතුව අනුව බඳවා ගැනීම සඳහා වූ ප්‍රමුඛතා ලේඛනය සකස් කෙරේ. ඉහළම කුසලතාවයක් දක්වා ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ දී අවශ්‍ය සුදුසුකම් නොමැතිබව අනාවරණය වුවහොත් එම අය පත්වීම් ලබා දීම සඳහා නුසුදුසු අයෙකු ලෙස සළකනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමක් සිදු නොකෙරේ.

11. *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් .*- ඉල්ලුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

12. අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ රු. 20,030 ක මාසික ආරම්භක ඒකාබද්ධ වැටුපක් හෝ ඊට වැඩි ආරම්භක වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

13. *ඉල්ලුම් කළ යුතු පිළිවෙල.*- මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාරව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත ප්‍රයෝජනයට ගනිමින්,

(i) අනු අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමුවන පිටුවට ද අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද ඇතුළත් වන සේ පිළියෙල කරගත් අයදුම්පත්‍රය තම අත් අකුරින්ම පිරවිය යුතුය.

(ii) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2012.06.05 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් "ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, නව නගරය, රත්නපුර" යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුරු නාමය සඳහන් කළ යුතුය. ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

(iii) එම ඉල්ලුම්පත්‍රයේ ඡායාපිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ. තව ද, සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර, අසම්පූර්ණ ලෙස තොරතුරු ඇතුළත් කර ඇති ඉල්ලුම්පත්‍ර හා ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලබන අතර ඉල්ලුම්පත්‍ර ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

14. විභාගය පැවැත්වෙන දිනය හා විභාග කාල සටහන විභාග අපේක්ෂකයින් වෙත පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් දන්වනු ලැබේ.

15. ලිඛිත විභාගයේ දී අනන්‍යතාව තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය පමණක් පිළිගනු ලැබේ.

16. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් සාමාන්‍යයෙන් පනවනු ලබන නීතිරීති මෙම විභාගය සඳහාද අදාළ වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

17. විභාගය ආරම්භ වන දිනයේ, විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

18. මෙම නිවේදනයෙන් අනාවරණය නොවන කරුණු පිළිබඳව හා පත්වීම් ලබා දීමේ අවසාන තීරණ ගැනීමේ බලය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු ය.

සුනේත්‍රා ගුණවර්ධන,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සබරගමුව පළාත.

2012 අප්‍රේල් මස 09 වැනි දින,
සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
පළාත් සභා කාර්යාල සංකීර්ණය, නවනගරය, රත්නපුර.

**ආදර්ශ අයදුම්පත්‍රය**

සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ භාෂා පරිවර්තක තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2012

Open Competitive Examination for Recruitment to Posts of Language Translator in the Sabaragamuwa Provincial Public Service - 2012

විභාගය අංකය [ ]

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය

සිංහල - 1
දෙමළ - 2
ඉංග්‍රීසි - 3 [ ]
(අදාල අංකය කොටුව තුළ ලියන්න)

1.0 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා.- PERERA, A. B. C.

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

1.5 ඉල්ලුම් කරන තනතුර :————.
(භාෂා පරිවර්තක(සිංහල/දෙමළ) හෝ (සිංහල/ඉංග්‍රීසි) යන වග පැහැදිලිව සඳහන් කරන්න)

2.0 2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)
2.3 ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
2.4 ස්ථිර පදිංචි පළාත :————.
2.5 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය ස්ත්‍රී -1
පුරුෂ -2 [ ]
(කොටුව තුළ අදාළ අංකය ලියන්න)

3.2 උපන්දිනය : වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

3.3 2012.06.05 දිනට වයස : අවුරුදු [ | ] මාස [ | ] දින [ | ]

4.0 අධ්‍යාපන සුදුසුකම් :

4.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය/ජා.පො.අ.ස.ප. විභාගය පිළිබඳ විස්තර :

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

4.2 අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

6.0 *වෘත්තීය හා වෙනත් සුදුසුකම්.-*

7.0 ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ?
(අදාල කොටුවේ ✓ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න)

| ඔව් | |
|---|---|

| නැත | |
|---|---|

8.0 දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූවකු නම්,

8.1 දෙපාර්තමේන්තුවේ /ආයතනයේ ලිපිනය :————.
8.2 දැනට දරන තනතුර :————.
8.3 සේවා කාලය :————.
8.4 ස්ථිර විශ්‍රාම වැටුප් හිමි හෝ තාවකාලික ද යන වග :————.

9.0 විභාග ගාස්තු ගෙවූ ලදු පත පිළිබඳ විස්තර :

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
(ii) ලදුපතේ අංකය හා දිනය :————.

(iii) ගෙවූ මුදල :————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.
(ලදුපතේ ඡායාපිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

10.0 *අයදුම්කරුගේ සහතිකය :-*

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත්, ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද, මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරනු ලබන මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඇ) තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය :————.

————,
අයදුම්කරුගේ අත්සන.

11.0 අයැදුම්කරුගේ අත්සන සහතික කිරීම.

මෙම අයැදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ............................................................. මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ............................... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද එම ලදු පත අලවා ඇති බව ද සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ
අත්සන.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

12.0 රජයේ හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයේ නියුතු අයදුම්කරුවෙකු නම් පහත නම් සඳහන් සහතිකයද දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරා ඇති නිලධාරියෙකු විසින් කළ යුතුය.

(1) මෙම දෙපාර්තමේන්තුවේ ...................................... දින සිට ............................................... තනතුරේ සේවය කරන මහතා/මහත්මිය/මෙනවිය ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට උපයාගත යුතු සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, අවවාද කිරීම් හැර කිසිදු විනය දඬුවමකට භාජනය වී නොමැති බවත් අයදුම්පතේ සපයා ඇති විස්තර නිවැරදි හා සත්‍ය බවත් සහතික කරමි.

(2) ඉහත තනතුර සඳහා ඔහු/ඇය තෝරාගතහොත් අයදුම්කරු දැනට දරන තනතුරෙන් මුදාහැරිය හැකි/නොහැකි බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තුව/ආයතනය
ප්‍රධානියාගේ හෝ බලය පවරනු
ලැබූ නිලධාරියාගේ අත්සන.

නම :————.
පදවියේ නම :————.
දිනය :————.
දෙපාර්තමේන්තුව/ආයතනය (කරුණාකර නිල මුද්‍රාව තබන්න)

05-22

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමේ තරග විභාග - 2012

දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩුව පවතින පහත දක්වා ඇති තනතුරුවලට බඳවා ගැනීම සඳහා මතු සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් මෙම කොමිෂන් සභාව විසින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය 2012.06.05 දින වේ.

සංකේත අක්ෂරය.-

(A) II පන්තියේ ග්‍රාම සංවර්ධන නිලධාරී තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය,

(B) දකුණු පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ III වන ශ්‍රේණියේ හෙද නිලධාරී තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය,

(C) III ශ්‍රේණියේ පේෂකර්ම උපදේශිකා තනතුරට බඳවා ගැනීමේ විවෘත (O) හා සීමිත (L) තරග විභාග,

(D) III ශ්‍රේණියේ කඩදාසි කර්මාන්ත ප්‍රදර්ශක/උපදේශක තනතුරට බඳවා ගැනීමේ විවෘත (O) හා සීමිත (L) තරග විභාග,

(E) III ශ්‍රේණියේ කොහු කර්මාන්ත ප්‍රදර්ශක/උපදේශක තනතුරට බඳවා ගැනීමේ විවෘත (O) හා සීමිත (L) තරග විභාග,

(F) දකුණු පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වාට්ටු ලිපිකාරිණී II 'ආ' ඛණ්ඩයට බඳවා ගැනීමේ තරග විභාගය.

02. බඳවා ගැනීම සිදුකරන අවස්ථාවේදී ඉහත තනතුරුවල පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීමේ බලය දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

03. *සුදුසුකම් :-*

(i) අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.

(ii) මනා ශාරීරික හා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුක්ත අය විය යුතු ය.

(iii) II පන්තියේ ග්‍රාම සංවර්ධන නිලධාරි තනතුර සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්නයේ වසර 05ක කාලය තුළ අනුගාමී වසර 03ක් අයදුම්කරනු ලබන දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිය සනාථ කළ යුතු අතර සෙසු තනතුරු සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්නයේ වසර 05ක කාලය තුළ දකුණු පළාත් සභා බල ප්‍රදේශය තුළ අනුගාමී වසර 03ක ස්ථිර පදිංචිය සනාථ කළ යුතු ය. පදිංචිය සනාථ කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතු ය.

(*අ*) මැතිවරණ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ඡන්ද හිමි නාමලේඛන උද්ධෘතය.

(*ආ*) ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන පදිංචි සහතිකය.

*සටහන.-* කඩදාසි කර්මාන්ත ප්‍රදර්ශක/උපදේශක තනතුර සඳහා පමණක්, දකුණු පළාත් සභා බල ප්‍රදේශය තුළ සුදුසුකම් සහිත අයදුම්කරුවන් නොමැති වුවහොත් වෙනත් පළාත් තුළ පදිංචි අයදුම්කරුවන්ගේ අයදුම්පත් ද සළකා බලනු ලැබේ.

(iv) රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් ස්ථිර කරන ලද නිලධාරින් ඉහත තනතුරු සඳහා අයදුම් කරන්නේ නම් ඔවුන්, ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර පහ තුළ කිසිදු විනය දඬුවමක් ලබා නොතිබිය යුතු අතර එම කාලය තුළ සියළු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු අතර සතුටුදායක සේවා කාලයක් සහිත අය විය යුතු ය.

(v) මෙම අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට ප්‍රථම ඒ ඒ තනතුරුවලට අදාළව පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

A. *II පන්තියේ ග්‍රාම සංවර්ධන නිලධාරී :*

(*අ*) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම,

*හෝ*

(*ආ*) අ.පො.ස. (උසස් පෙළ) විභාගය එකවර විෂයයන් 03කින් සමත්වීම,

*හා*

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පළාත් රාජ්‍ය සේවයේ/රාජ්‍ය සේවයේ කළමනාකරණ සහකාර තනතුරක හෝ ඊට ඉහළ සුදුසුකම් සහිත තනතුරක අඛණ්ඩව වසර 07ක සක්‍රීය සේවා කාලයක් තිබිය යුතු අතර, සුදුසුකම් ලැබීම සඳහා වන සේවා කාලය තුළ සියලුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන තිබිය යුතු අතර විනයානුකූල දඬුවම් ලබා නොතිබිය යුතු ය.

*සටහන.-* සියලුම අයදුම්කරුවන් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී, විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ (සම්මාන 4) සහිතව, සිංහල/දෙමළ භාෂාව හා ගණිතය විෂයයන් ඇතුළුව විෂයයන් හයකින් (6) සමත්වී තිබිය යුතු ය.

B. *දකුණු පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ III වැනි ශ්‍රේණියේ හෙද නිලධාරී*

(*අ*) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව/සෞඛ්‍ය හා තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථ (සම්මාන 3) සහිතව ගණිතය සමත්ව එක්වරකදී විෂයයන් හයකින් (6) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම.

*සහ*

(*ආ*) අ.පො.ස. (උසස්පෙළ) විභාගයේදී අවම වශයෙන් එක් විෂයයකින් හෝ (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්වීම.

*සහ*

(*ඇ*) ලියාපදිංචි නේවාසිකාගාරයක සාත්තු සේවය හා හෙද සේවය පිළිබඳ වසරක ප්‍රායෝගික පළපුරුද්දක් සඳහා සහතිකයක් ලබා තිබිය යුතු ය.

C. *පේෂකර්ම උපදේශිකා - විවෘත තරග විභාගය*

(*අ*) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හා ගණිතය විෂයයන් ඇතුළුව විෂයයන් තුනකට සම්මාන සාමාර්ථ (සම්මාන 3) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (6) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම.

*හා*

(*ආ*) රජයේ ලලිත කලා ආයතනයක පේෂ කර්මාන්තය පිළිබඳ උසස් පාඨමාලාව හෝ තුන් අවුරුදු සහතිකය

*හෝ*

පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන තුන් අවුරුදු හෝ දෑ අවුරුදු සහතිකය

*හෝ*

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී පේෂ කර්මාන්ත විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව රජයේ පිළිගත් ආයතනයක වියන්නියක් වශයෙන් තුන් අවුරුදු කාලයක පළපුරුද්ද ලබා තිබීම.

*පේෂකර්ම උපදේශිකා - සීමිත තරග විභාගය :*

(*අ*) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හා ගණිතය විෂයයන් ඇතුළුව විෂයයන් තුනකට සම්මාන සාමාර්ථ (සම්මාන 3) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (6) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම.

*හා*

(ආ) රජයේ ලලිත කලා ආයතනයක පේෂ කර්මාන්තය පිළිබඳ උසස් පාඨමාලාව හෝ තුන් අවුරුදු සහතිකය

*හෝ*

පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන තුන් අවුරුදු හෝ දෑඅවුරුදු සහතිකය

*හෝ*

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී පේෂ කර්මාන්ත විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව රජයේ පිළිගත් ආයතනයක වියන්නියක් වශයෙන් තුන් අවුරුදු කාලයක පළපුරුද්ද ලබා තිබීම.

*හා*

(ඇ) ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය නොවන අර්ධ ශිල්පීය හා ශිල්පීය ගණයන්ට අයත් වන සතුටුදායක සේවා කාලයක් සහිත ස්ථිර සේවකයෙකු වීම.

D. *කඩදාසි කර්මාන්ත ප්‍රදර්ශක/උපදේශක - විවෘත තරග විභාගය :*

(අ) ගණිතය විෂයය ඇතුළුව විෂයයන් හයකින් (6) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම.

*හා*

(ආ) කඩදාසි කර්මාන්තයට අදාලව දකුණු පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව (දකුණු පළාත් කර්මාන්ත නියෝජ්‍ය ලේකම් කාර්යාලය) හෝ රජය පිළිගත් ආයතනයක් මගින් හෝ ජාතික ශිල්ප සභාව මගින් පවත්වන ලද හය මාසික හෝ ඊට වැඩි පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම.

*හෝ*

කඩදාසි කර්මාන්ත ක්ෂේත්‍රයේ වසර දෙකක පළපුරුද්දක් ලබාතිබීම.

*කඩදාසි කර්මාන්ත ප්‍රදර්ශක/උපදේශක - සීමිත තරග විභාගය :*

(අ) ගණිතය විෂයය ඇතුලුව විෂයයන් හයකින් (6) අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම.

*හා*

(ආ) දකුණු පළාත් කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ඇති කඩදාසි කර්මාන්ත ආයතනයක අවුරුදු 2 සේවා පළපුරුද්දක් ලබා ඇති ස්ථිර සේවකයෙකු වීම.

E. *කොහු කර්මාන්ත ප්‍රදර්ශක/උපදේශක තනතුර - විවෘත තරග විභාගය*

(අ) ගණිතය විෂයය ඇතුළුව විෂයයන් හයකින් (6) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම.

*හා*

(ආ) කොහු කර්මාන්තයට අදාලව දකුණු පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව (දකුණු පළාත් කර්මාන්ත නියෝජ්‍ය ලේකම් කාර්යාලය) හෝ රජය පිළිගත් ආයතනයක් මගින් හෝ ජාතික ශිල්ප සභාව මගින් පවත්වන ලද හය මාසික හෝ ඊට වැඩි පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම.

*හෝ*

කොහු කර්මාන්ත ක්ෂේත්‍රයේ වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම.

*කොහු කර්මාන්ත ප්‍රදර්ශක/උපදේශක තනතුර - සීමිත තරග විභාගය :*

(අ) ගණිතය විෂයය ඇතුලුව විෂයයන් හයකින් (6) අ.පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම.

*හා*

(ආ) දකුණු පළාත් කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ඇති කොහු කර්මාන්ත ආයතනයක අවුරුදු 2 සේවා පළපුරුද්දක් ලබා ඇති ස්ථිර සේවකයෙකු වීම.

F. *දකුණු පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වාට්ටු ලිපිකාරිණී II "ආ" බණ්ඩය :*

(අ) සිංහල/දෙමළ/ ඉංග්‍රීසි භාෂාව හෝ සාහිත්‍ය හා ගණිතය විෂයයන් ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ (සම්මාන 4) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (6) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම.

*හෝ*

පළමු භාෂාව, ගණිතය ඇතුළු විෂයයන් 04කින් "බී" ශ්‍රේණියේ සාමාර්ථයක් ඇතිව යටත් පිරිසෙයින් විෂයයන් 6කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී ජාතික පොදු සහතික පත්‍ර විභාගය සමත්වීම

*හෝ*

ඒ හා සමාන විභාගයකින් සමත්වීම.

*සටහන.-* ඉහත සුදුසුකම් ඇති, දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු අවුරුදු 06කට නොඅඩු, අනියම් අඛණ්ඩ සේවා කාලය ඇතුළු ස්ථිර සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති කණිෂ්ඨ සේවිකාවන්ද මෙම තනතුර සඳහා ඉල්ලුම් කිරීමට සුදුස්සෝ වෙති.

04. *වයස.-*

(A) *II පන්තියේ ග්‍රාම සංවර්ධන නිලධාරී තනතුර :*

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.

(B) *දකුණු පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ III වැනි ශ්‍රේණියේ හෙද නිලධාරී තනතුර :*

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

(C) *පේෂකර්ම උපදේශිකා*

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු සීමිත අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

(D) *කඩදාසි කර්මාන්ත ප්‍රදර්ශක/උපදේශක තනතුරු*

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 40ට නොවැඩි විය යුතු ය. දැනටමත් රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු සීමිත අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

(E) *කොහු කර්මාන්ත ප්‍රදර්ශක/උපදේශක තනතුර*

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 40ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු සීමිත අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

(F) *දකුණු පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වාට්ටු ලිපිකාරිණී II 'ආ' ඛණ්ඩය*

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

05. *වැටුප් ක්‍රමය :-*

(A) II පන්තියේ ග්‍රාම සංවර්ධන නිලධාරි තනතුර

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006(IV) MN 5-2006 - A අනුව මාසික වැටුප් පරිමාණය රු. 16,720 - 10 x 320 - 11 x 365 - 15x 450 - 30,685 වේ.

(B) දකුණු පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ III වැනි ශ්‍රේණියේ හෙද නිලධාරි,

(C) පේෂකර්ම උපදේශිකා,

(D) කඩදාසි කර්මාන්ත ප්‍රදර්ශක/උපදේශක,

(E) කොහු කර්මාන්ත ප්‍රදර්ශක/උපදේශක තනතුර, හා

(F) දකුණු පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වාට්ටු ලිපිකාරිණී II ආ ඛණ්ඩය යන තනතුරු සඳහා -

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006(IV) MN 1-2006 - A අනුව මාසික වැටුප් පරිමාණය රු. 13,120 - 10 x 145 - 11 x 170 - 10x 240 - 10x 320 -රු. 22,040 වේ.

06. *අයදුම්පත්‍ර.-*

(අ) මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව ඒ 4 (සෙ. මී. 21 x 30) ප්‍රමාණයේ කඩදාසිය දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කළ යුතුය. අංක 01 සිට 09 දක්වා ශීර්ෂ පළමු වැනි පිටුවෙහි ද, අංක 10 සිට 12 දක්වා ශීර්ෂ දෙවැනි පිටුවට ද, ඇතුළත් වන පරිදි සකස් කර ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිළිව ඇතුළත් කළ යුතුය.

(ආ) නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2012.06.05 දිනට පෙර ලේකම්, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල, 6 වැනි මහල, ගාල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "දකුණු පළාත් රාජ්‍ය සේවයේ ............................ (අදාළ තනතුරෙහි නම) තනතුරට බඳවා ගැනීමේ විවෘත/සීමිත තරග විභාගය - 2012" යන්න සඳහන් කළ යුතුය. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තනතුරු කීපයක් සඳහා ඉල්ලුම් කරන්නේ නම් එක් එක් තනතුරු සඳහා අයදුම්පත්‍ර වෙන වෙනම ඉදිරිපත් කළ යුතු අතර කිසිදු සහතික පත්‍රයක්/ඡායා පිටපතක් අයදුම්පත සමග අමුණා නොඑවිය යුතු ය.

(ඇ) ඉල්ලුම්පත්‍රය සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙනි.

(ඈ) රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් තම අයදුම්පත දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(ඉ) ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති හා අයදුම්පත්‍ර කැඳවන අවසාන දිනට පසුව මුදල් ගෙවූ කුවිතාන්සි ඇතුළත් අයදුම්පත්, මුදල් ගෙවූ කුවිතාන්සි අලවා නොමැති අයදුම්පත් හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව මෙම කොමිෂන් සභාව වගකියනු නොලැබේ. අයදුම්පත් ලද බව හෝ ප්‍රතික්ෂේප කළ බව අයදුම්කරුවන් වෙත දන්වනු නොලැබේ.

(ඊ) අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු, හෝ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

07. *විභාග ගාස්තු.-*

(අ) මෙම විභාගය සඳහා අයදුම් කරන සෑම අයදුම්කරුවෙකු විසින්ම විභාග ගාස්තු ලෙස රු. 400ක මුදලක් දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක 20-03-20-39 දරන අය ශීර්ෂයට බැර වන පරිදි දකුණු පළාත තුළ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙනසේ ඇලවිය යුතුය. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම දැන්වීමේ සඳහන් නොවන අයුරින් මුදල් ගෙවා ලබාගන්නා ලද ලදුපත් සහිත අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර, කුමන හේතුවක් නිසාවත් ගෙවන ලද විභාග ගාස්තු ආපසු ගෙවීමක් හෝ මාරු කිරීමක් සිදුකරනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. තව ද, අපේක්ෂකයින් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම විභාග ශාලාධිපති සෑහීමට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය:-

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,

2. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

විභාගය පැවැත්වීමට නියමිත දිනට දින 07කට කලින් ප්‍රවේශ පත්‍ර නොලද අපේක්ෂකයින් පහත සඳහන් විස්තර ඇතිව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලියා හෝ දුරකථන අංක 091-2234309 ඔස්සේ දැන්විය යුතුය :-

1. විභාගයේ නම,
2. අයදුම්කරුගේ සම්පූර්ණ නම,
3. සම්පූර්ණ ලිපිනය,
4. ඉල්ලුම්පත් තැපැල් කළ කාර්යාලය හා ලියාපදිංචි කළ අංකය හා දිනය.

අයදුම්පත්‍ර නොලැබී හෝ අස්ථානගත වීමක් හේතුවෙන් ප්‍රවේශපත්‍ර නොලැබී ගියහොත් ප්‍රවේශපත්‍රය ලබා ගැනීමට අයදුම්පත්‍රයේ පිටපතක් සමග ලියාපදිංචි කළ කුවිතාන්සියේ පිටපතක් රැගෙන කොමිෂන් සභා කාර්යාලයට අයදුම්කරු හෝ අයදුම්කාරිය විසින්ම පැමිණිය යුතුය.

08. *සේවයේ නියුක්ත කිරීමේ වගන්ති හා කොන්දේසි.-*

(අ) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 අනුව වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(ආ) තෝරාගනු ලබන අයදුම්කරුවන් එම අවස්ථාව වන විට රාජ්‍ය සේවයේ තනතුරක ස්ථිර කර නොසිටී නම් ඔවුන් තුන් අවුරුදු පරිවාස කාලයක් මත අදාළ තනතුරට පත් කරනු ඇත. රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත නිලධාරියෙකු නම් ඔහුගේ පත්වීම එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත් වනු ඇත.

09. *මාධ්‍ය.-*

විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා මාධ්‍ය තුනෙන්ම පැවැත් වේ. ඉල්ලුම්කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

10. *විභාග ක්‍රමය.-*

A. *II පන්තියේ ග්‍රාම සංවර්ධන නිලධාරි*

1. අභියෝග්‍යතා පරීක්ෂණය - කාලය පැය 1 යි, ලකුණු 100 යි.
2. සාමාන්‍ය දැනීම - කාලය පැය 1 යි, ලකුණු 100යි.

සමත්වීම සඳහා එක් එක් විෂයයකට 40% කට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබාගත යුතුය.

B. *දකුණු පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ III වැනි ශ්‍රේණියේ හෙද නිලධාරි*

සාමාන්‍ය දැනීම හා අභියෝග්‍යතාවය - කාලය පැය 1යි, ලකුණු 100 යි.

සමත්වීම සඳහා 40%කට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබාගත යුතුය.

C. *පේෂකර්ම උපදේශිකා.-*

(1) *ලිඛිත පරීක්ෂණය.-*

විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය - කාලය පැය 3යි, ලකුණු 100යි. පේෂ ගණිතය, පේෂ සටහන්, යන්ත්‍ර ඇඳීම, පේෂ කර්මාන්ත පිළිබඳ සාමාන්‍ය දැනීම යන විෂයයන් ආවරණය වන පරිදි සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි.

සමත්වීම සඳහා 40% කට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබාගත යුතුය.

(2) *ප්‍රායෝගික පරීක්ෂණය* - කාලය පැය 2යි, ලකුණු 100 යි. වෘත්තියට අදාළ වන පරිදි වෘත්තීය හැකියාව සම්බන්ධ ප්‍රායෝගික පරීක්ෂණයකි.

සමත්වීම සඳහා 50% කට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබාගත යුතුය.

D. *කඩදාසි කර්මාන්ත ප්‍රදර්ශක/උපදේශක.-*

1. ලිඛිත පරීක්ෂණය.- විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය - කාලය පැය 3 යි, ලකුණු 100 යි.

අත්කඩදාසි නිෂ්පාදනයේ මූලධර්ම, අත් කඩදාසි වර්ග හා සකස් කිරීමේ ක්‍රියාවලිය, අත්කඩදාසි භාවිතයට යොදා ගන්නා රසායනික ද්‍රව්‍ය පිළිබඳ දැනීම, අත්කඩදාසි සකස් කිරීමේ ඇස්තමේන්තු පිළියෙල කිරීම යන විෂයයන් ආවරණය වන පරිදි සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි.

සමත්වීම සඳහා 40% කට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබාගත යුතුය.

2. ප්‍රායෝගික පරීක්ෂණය.- කාලය පැය 2යි, ලකුණු 100යි.

වෘත්තියට අදාළ වන පරිදි වෘත්තීය හැකියාව සම්බන්ධ ප්‍රායෝගික පරීක්ෂණයකි. සමත්වීම සඳහා 50% කට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබාගත යුතුය.

E. *කොහු කර්මාන්ත ප්‍රදර්ශක/උපදේශක තනතුර.-*

1. ලිඛිත පරීක්ෂණය - විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය - කාලය පැය 3 යි. ලකුණු 100යි.

වෘත්තියට අදාළ ගණිතය, කොහු සකස් කිරීම හා කොහු වර්ග හඳුනාගැනීම, කොහු අංශයේ ඇස්තමේන්තු සැකසීම හා මෝස්තර නිර්මාණය, ඩයි වර්ග, වියමන් ක්‍රම, පාපිසි වර්ග, ඩයි කරන ක්‍රම හැඳින්වීම යන විෂයයන් ආවරණය වන පරිදි සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි.

සමත්වීම සඳහා 40% කට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබාගත යුතුය.

2. ප්‍රායෝගික පරීක්ෂණය - කාලය පැය 2යි, ලකුණු 100 යි.

වෘත්තියට අදාළ වන පරිදි වෘත්තිය හැකියාව සම්බන්ධ ප්‍රායෝගික පරීක්ෂණයකි. සමත්වීම සඳහා 50% කට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබාගත යුතුය.

F. දකුණු පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වාට්ටු ලිපිකාරිණී II 'ආ' ඛණ්ඩය

1. බුද්ධි පරීක්ෂණය - කාලය පැය 1 යි, ලකුණු 100 යි.
2. සාමාන්‍ය දැනීම - කාලය පැය 1 යි. ලකුණු 100 යි.

සමත්වීම සඳහා එක් එක් විෂයයකට 40% කට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබාගත යුතුය.

11. *විභාගය පැවැත්වීමට යෝජිත නගර.-*

විභාග මධ්‍යස්ථාන පිහිටුවීමට යෝජිත නගරයන් පහත පරිදි වේ. යම් නගරයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති වූ විට විභාගය ආසන්නතම නගරයේ දී පවත්වනු ඇත. අයදුම්කරුවන්, නගරය ලෙස සඳහන් කළ යුත්තේ අයදුම්කරු ස්ථිර පදිංචිය ඇති දිස්ත්‍රික්කයේ පහත සඳහන් නගරයක් පමණි.

| දිස්ත්‍රික්කය | නගරය |
|---|---|
| ගාල්ල<br>මාතර<br>හම්බන්තොට | ගාල්ල<br>මාතර<br>තංගල්ල |

12. *තෝරාගැනීමේ ක්‍රමය.-*

(අ) මෙම තනතුරු සඳහා ඉහත 10 ඡේදයේ දක්වා ඇති පරීක්ෂණවලින් දක්වන ලද කුසලතාවය හා රා.ප.ච. 15/90 හි සඳහන් විධිවිධාන හා දිස්ත්‍රික් ජනගහණ අනුපාතයට අනුව සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයකින් පසුව සුදුස්සන් තෝරාගනු ලැබේ. (පත්වීම් ප්‍රදානයේ දී පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව පත්වීම් දිය යුතු අවසාන ප්‍රමුඛතා මට්ටමේ සම ලකුණු ලැබූ අයදුම්කරුවන් කිහිපදෙනෙකු සිටින අවස්ථාවක දී සම්මුඛ පරීක්ෂණයක් පවත්වා අධ්‍යාපන සුදුසුකම් අනුව ඉහළම සුදුසුකම් ඇති පුද්ගලයන් අනුපිළිවෙලින් තෝරාගැනේ. ) යම් දිස්ත්‍රික්කයකින් පිරවිය යුතු ඇබෑර්තු සංඛ්‍යාව සඳහා තරග කිරීමට සුදුස්සන් වනුයේ එම දිස්ත්‍රික්කයෙන් ඉල්ලුම්කරන අයදුම්කරුවන් පමණි.

(ආ) පේෂකර්ම උපදේශිකා, කඩදාසි කර්මාන්ත ප්‍රදර්ශක/උපදේශක හා කොහු කර්මාන්ත ප්‍රදර්ශක/උපදේශක තනතුරු සඳහා මුළු ලකුණු අනුපිළිවෙල අනුව, ලිඛිත පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් පමණක් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වෘත්තීය යෝග්‍යතා පරීක්ෂණයට කැඳවන අතර එයින් සමත්වීම සඳහා 50% කට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබාගත යුතුය.

(ඇ) සුදුසුකම් පරීක්ෂා කිරීමකින් තොරව සෑම අයදුම්කරුවෙකුටම විභාගයට ඉදිරිපත් වීම සඳහා අවස්ථාව ලබාදෙනු ලැබේ. විභාග ප්‍රතිඵල මත කුසලතාවය අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, අයදුම්පත් කැඳවන අවසාන දිනට, නිවේදනය ප්‍රකාර සුදුසුකම් ලබා නොමැති අයදුම්කරුවන් පත්වීමක් ලැබීමට සුදුසුකම් නොලබන්නේ ය.

13. *සාවද්‍ය තොරතුරු සැපයීම.-*

මෙම විභාගයට ඉදිරිපත් වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුව ද, අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන ඉදිරිපත් කර ඇති බව පෙනී ගියහොත් ඔහු සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

මෙම නිවේදනයේ සඳහන් නොවන වෙනත් ඕනෑම කරුණක් පිළිබඳව අවසාන තීරණයක් ගැනීම දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වන්නේ ය.

සමන් දර්ශන පාඩිකෝරාල,
ලේකම්,
දකුණු පළාත් රාජ්‍ය සේවා
කොමිෂන් සභාව.

2012 අප්‍රේල් මස 17 වැනි දින,
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල,
6 වැනි මහල, ගාල්ල.

(මෙම දැන්වීම පදනම් කරගෙන විවිධ ආයතන විසින් සාවද්‍ය ලෙස සකස් කර ඉදිරිපත් කරනු ලබන දැන්වීම්වල සඳහන් කරුණු සහිත අයදුම්පත්‍ර කෙරෙහි කිසිදු වගකීමක් දරනු නොලැබේ.)

### ආදර්ශ අයදුම්පත්‍රය

තනතුරට අදාළ සංකේත අක්ෂරය [ ] විවෘත/සීමිත [ ]

(A/B/C/D/E/F) (O/L)

ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය [ ]

දකුණු පළාත් රාජ්‍ය සේවයේ .................................................................. තනතුරට බඳවා ගැනීමේ ....................................................... තරග විභාගය - 2012

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා [ ]

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
( සිංහල - 2, දෙමළ - 3, ඉංග්‍රීසි - 4)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) [ ]

විභාග නගරය [ ]

(විභාග නිවේදනයේ 11 වැනි ඡේදය බලන්න)

01. අයදුම්කරුගේ මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :

(i) සිංහලෙන් :————.
(ii) ඉංග්‍රීසියෙන් (කැපිටල් අකුරෙන්) :————.
*උදා* :- NIMAL, M.A.S., නිමල්, එම්. ඒ. එස්.

02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.

03. (i) ස්ථිර ලිපිනය :————.
(ii) සේවා ස්ථානයේ නම හා ලිපිනය :————.
(iii) දුරකථන අංකය :————.

04. ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :

(i) සිංහලෙන් :————.
(ii) ඉංග්‍රීසියෙන් (කැපිටල් අකුරින්) :————.

05. ස්ත්‍රී /පුරුෂ භාවය : ස්ත්‍රී - 1, පුරුෂ - 0 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න).

06. ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

නිකුත් කළ දිනය :————.

07. විවාහක /අවිවාහක බව : අවිවාහක - 1 විවාහක - 2 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

08. උපන් දිනය : වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස :

අවුරුදු [ | ] මාස [ | ] දින [ | ]

09. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද ? ලියාපදිංචියෙන් ද ? :————.

(i) ඔබගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
(iii) ග්‍රාම නිලධාරී කොට්ඨාසය :————.
(iv) දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින කාල සීමාව :-.................දින සිට.............. දින දක්වා

10. අධ්‍යාපන සුදුසුකම්.-

10.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර.-

| පළමුවර | | | | දෙවනවර | | | |
|---|---|---|---|---|---|---|---|
| වර්ෂය :—————.<br>විභාග අංකය :—————. | | | | වර්ෂය :—————.<br>විභාග අංකය :—————. | | | |
| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
| 1. | | 5. | | 1. | | 5. | |
| 2. | | 6. | | 2. | | 6. | |
| 3. | | 7. | | 3. | | 7. | |
| 4. | | 8. | | 4. | | 8. | |

10.2 අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර.-

| *වර්ෂය හා මාසය* | | *විභාග අංකය* | |
|---|---|---|---|
| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
| 1. | | 3. | |
| 2. | | 4. | |

10.3 උපාධිය පිළිබඳ විස්තර / ලබා ඇති වෘත්තිය සුදුසුකම්.-

| *උපාධිය /ඩිප්ලෝමා/ වෘත්තීය සහතිකයේ නම* | *වලංගු වන දිනය* | *විෂයයන්* | *සාමාර්ථතාව* | *විශ්ව විද්‍යාලය/ නිකුත් කළ ආයතනයේ නම* |
|---|---|---|---|---|
| | | | | |

11. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූවෙකු නම්.-

(i) දෙපාර්තමේන්තුව/ආයතනය :—————.
(ii) දැනට දරන තනතුර :—————.
(iii) පත්වීම් දිනය :................ දින සිට ........................ දක්වා සේවා කාලය අවු. :—————.
(iv) ස්ථිර විශ්‍රාම වැටුප් හිමි හෝ තාවකාලික ද යන වග :—————.
(සේවය ස්ථිර කිරීමේ ලිපියේ පිටපතක් අමුණන්න)

12. මුදල් ගෙවූ ලදුපත මෙහි නොගැලවෙන සේ අලවන්න. (ලදු පතෙහි ඡායා පිටපතක් ළඟ තබාගන්න.)

| |
|---|
| |

*අයදුම්කරුගේ ප්‍රකාශය :-*

මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු සියල්ල මාගේ දැනීමේ හා විශ්වාසය අනුව නිවැරදි සහ සත්‍ය බවත්, විභාග ගාස්තුව ගෙවූ ........................................................................ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අංක ..................................... හා ...................................... දින දරන ලදුපත මෙහි අලවා ඇති බවත්, මෙම තනතුරට මා නුසුදුස්සෙකු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගයෙන් පසු හෝ පත්වීම් ලැබීමෙන් පසු සේවයෙන් පහ

කරනු ලැබීමට යටත් වන බවත් මම පිළිගනිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟ වෙමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

*අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :-*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................................................................... මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ................................................... වැනි දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

—————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :—————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :—————.
තනතුර :—————.
ලිපිනය (නිල මුද්‍රාව තබන්න) :—————.

(රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවෙකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කළ යුතුය.)

ආයතන ප්‍රධානියාගේ /දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය.-

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .................................................................. මයා/මිය/මෙනවිය ........................................................................කාර්යාලයේ/ආයතනයේ ..........................................................දින සිට ...........................................................තනතුරක සේවය කරන බවද, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක වන බවද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි බවද/කළ නොහැකි බවද ඇය/ඔහු මෙතෙක් මොනයම් ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව ද ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවද සහතික කරමි.

—————,
ආයතන ප්‍රධානියා/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :—————.
ආයතන ප්‍රධානියා/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සම්පූර්ණ නම :—————.
තනතුර :—————.
ලිපිනයඃ- (නිල මුද්‍රාව තබන්න)

05-76

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### * ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* රු. ශ. | *තැපැල් ගාස්තුව* රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිළ** රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2012** | | | |
| මැයි | 2012.05.04 | සිකුරාදා | 2012.04.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.05.11 | සිකුරාදා | 2012.04.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.05.18 | සිකුරාදා | 2012.05.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.05.25 | සිකුරාදා | 2012.05.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජුනි | 2012.06.01 | සිකුරාදා | 2012.05.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.06.08 | සිකුරාදා | 2012.05.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.06.15 | සිකුරාදා | 2012.06.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.06.22 | සිකුරාදා | 2012.06.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.06.29 | සිකුරාදා | 2012.06.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2012.07.06 | සිකුරාදා | 2012.06.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.07.13 | සිකුරාදා | 2012.06.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.07.20 | සිකුරාදා | 2012.07.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.07.27 | සිකුරාදා | 2012.07.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.